සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

# දෙවන වාර පරීක්ෂණය

| 09 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව | කාලය : පැය දෙකයි |
|---|---|---|

නම / විභාග අංකය :

## I - කොටස

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) භූ විෂමතා ලක්ෂණයක් ලෙස ශේෂ කඳු දැකගත හැක්කේ,
(මධ්‍යම කඳුකරයේ / අභ්‍යන්තර තැනිතලාවේ / වෙරළබඩ තැනිතලාවේ)

(02) ලෝකයේ උණුසුම් ම දේශගුණය සහිත ආසියාතු කලාපයේ පිහිටා ඇති කාන්තාරය වන්නේ,
(සහරා / තාර් / ඇටකාමා)

(03) මහවැලි ගඟේ දිග ප්‍රමාණය වනුයේ,
(335 km / 350 km / 453 km)

(04) මධ්‍යම කඳුකරයේ පිහිටා ඇති තෙත් කලාපයට වැඩිපුර වර්ෂාවක් ලැබෙනුයේ,
(සංවහන වර්ෂාවෙනි / නිරිතදිග මෝසම් වර්ෂාවෙනි / ඊසානදිග මෝසම් වර්ෂාවෙනි)

(05) යුප්‍රටීස් සහ ටයිග්‍රීස් ගංගා ගලා බසින ස්ථානය වනුයේ,
(පැසිෆික් සාගරය / ඊරල් මුහුද / පර්සියන් බොක්ක)

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ කියවා ඒවා නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

(06) ජපානය ආසියාවේ පිහිටි ප්‍රධාන කාර්මික රටකි. (...........)

(07) ලොව වැඩි ම ජන සංඛ්‍යාවක් වාසය කරනුයේ ආසියාතු ප්‍රදේශයේ ය. (...........)

(08) ශ්‍රී ලංකාවේ වෙරළබඩ තැනිතලාව උතුරේ දී පුළුල්ව ද දකුණේ දී පටුව ද විහිදේ. (...........)

(09) භූ විෂමතා ලක්ෂණ අනුව ශ්‍රී ලංකාව භූ විෂමතා කලාප දෙකකට බෙදිය හැකි ය. (...........)

(10) යාපනය අර්ධද්වීපයේ හුණු ගල් බහුලව ව්‍යාප්තව ඇති අතර තෙත් දේශගුණයක් දැකගත හැකි ය. (...........)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

(ආසියාතු / පතන ශීඝ්‍රතාව / බස්නාහිර / කච්චාන් / ඒක ශීර්ෂ ආදායම)

(11) නිරිතදිග මෝසම් සුළං ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවලට හමා යනුයේ වියළි සුළං ලෙස ය. මෙම වියළි සුළඟ මඩකලපුව ප්‍රදේශයේ දී .................................................... යනුවෙන් හැඳින්වේ.

(12) අල්තායි, කුන්ලුන්, ටියෙන්ෂාන් යන කඳු පන්ති පිහිටා ඇත්තේ .............................................. කලාපයේ ය.

(13) භූමියේ උස අනුව ක්‍රමයෙන් උෂ්ණත්වය අඩු වීම ........................................................................ ලෙස හැඳින්වේ.

(14) කිසියම් රටක නිශ්චිත කාල සීමාවක් තුළ ජාතික ආදායමෙන් එක් පුද්ගලයකුට අයත් වන කොටස .................................................................................. යනුවෙන් හැඳින්වේ.

(15) ශ්‍රී ලංකාවේ මුළු ජන සංඛ්‍යාවෙන් 1/4 ක ප්‍රමාණයක් ........................................................................ පළාතේ ජීවත් වේ.

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල (අ) කොටසට ගැළපෙන පිළිතුර (ආ) කොටසින් තෝරා ඊට අදාළ ඉංග්‍රීසි අක්ෂරය (අ) කොටස ඉදිරියෙන් ඇති වරහන තුළ ලියා දක්වන්න.**

| 'අ' කොටස | | 'ආ' කොටස |
|---|---|---|
| (16) බොක්කකි, | (...........) | A - ඔවුල් |
| (17) වෙරළ දඹයකි, | (...........) | B - කලා ඔය |
| (18) ඩෙල්ටාවකි, | (...........) | C - හලාවත |
| (19) කලපුවකි, | (...........) | D - වැලිගම |
| (20) තුඩුවකි, | (...........) | E - රූමස්සල |
| | | F - පිදුරුතලාගල |

(ලකුණු 2 x 20 = 40)

## II - කොටස

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. (පළමුවන ප්‍රශ්නයට ලකුණු 20ක් ද, අනෙක් එක් එක් ප්‍රශ්නයට ලකුණු 10 බැගින් ද හිමි වේ.)**

(01) අ) පහත දී ඇති ස්ථාන සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

i. මහවැලි ගඟ


ii. ඩෙල්ෆ්ට් දූපත

iii. මීගමුව කලපුව

iv. කතරගම

v. සීගිරිය

(ල. 2 x 5 = 10)




ආ) පහත දී ඇති ස්ථාන සපයා ඇති ලෝක සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

i. රතු මුහුද    ii. සුමාත්‍රා    iii. සයිබීරියන් තැන්න

iv. බැංකොක්    v. චීනය

(ල. 2 x 5 = 10)




(02) 1. ආසියාතු ප්‍රදේශය යුරෝපයෙන් වෙන් කරන මායිම දෙකක් සඳහන් කරන්න. (ල. 02)

2. ආසියාතු කලාපයට අයත් විල් දෙකක් නම් කරන්න. (ල. 03)

3. ආසියාතු කලාපයෙහි හඳුනාගත හැකි දේශගුණික කලාප තුනක් නම් කර, ඉන් එකක් පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

(03) 1. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය සඳහන් කරන්න. (ල. 02)

2. ශ්‍රී ලංකාව ප්‍රධාන භූ විෂමතා කලාප තුනකට බෙදේ. ඒවා නම් කරන්න. (ල. 03)




3. අ) ඉදිරියෙන් දී ඇති සිතියමෙහි 1, 2, 3 ලෙස නම් කර ඇති කඳුවැටි අනුපිළිවෙළින් නම් කරන්න. (ල. 03)

ආ) ඉදිරියෙන් දී ඇති සිතියමෙහි A සහ B ලෙස නම් කර ඇති සානු නම් කරන්න. (ල. 02)

(04) 1. ''වර්ෂාපතනය'' යන්න කෙටියෙන් හඳුන්වා ශ්‍රී ලංකාවට වර්ෂාපතනය ලැබෙන ප්‍රධාන ක්‍රම ගණන ලියා දක්වන්න. (ල. 02)

2. මෝසම් වර්ෂාපතනය ලැබෙන ක්‍රම දෙක හා ඒවා ලැබෙන කාලසීමා සඳහන් කරන්න. (ල. 03)

3. සංවහන වර්ෂාව කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

(05) 1. ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශගුණික කලාප දෙකක් ලියන්න. (ල. 02)

2. ශ්‍රී ලංකාවේ පවතින වනාන්තර වර්ග තුනක් ලියන්න. (ල. 03)

3. පහතරට තෙත් කලාපයේ දක්නට ලැබෙන වනාන්තරවල ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

(06) 1. ජනාවාසයක් යනු කුමක් ද? (ල. 02)

2. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජනාවාස වර්ග තුනක් නම් කරන්න. (ල. 03)

3. ගැමි නාගරික ජනාවාසයක් යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

# දෙවන වාර පරීක්ෂණය

**09 ශ්‍රේණිය** | **භූගෝල විද්‍යාව** | **විසඳුම් පත්‍රය**

## I - කොටස

(01) අභ්‍යන්තර තැනිතලාවේ (02) තාර් (03) 335 km (04) නිරිතදිග මෝසම් වර්ෂාවෙනි

(05) පර්සියන් බොක්ක (06) ✓ (07) ✓ (08) ✓

(09) × (10) × (11) කච්චාන් (12) ආසියානු (13) පතන ශීඝ්‍රතාව


(14) ඒක ශීර්ෂ ආදායම (15) බස්නාහිර (16) D (17) E

(18) B (19) C (20) A


(ලකුණු 2 x 20 = 40)

## II - කොටස

(01) I. අ) ආ)




(ල. 2 x 5 = 10)




(ල. 2 x 5 = 10)

(මුළු ල. 20)

(02) 1. යූරල් කඳු, යූරල් ගංගාව, කැස්පියන් මුහුද, කොකේසස් කඳු, කළු මුහුද (ල. 02)

2. බයිකල්, බොල්කෑෂ් (ල. 03)

3. නිවර්තන කලාපය, සෞම්‍ය කලාපය, ශීත කලාපය

* නිවර්තන කලාපය - වසර පුරා අධික උෂ්ණත්වයෙන් යුක්තය, සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය $18^0C$ ට වඩා වැඩිය.

* සෞම්‍ය කලාපය - වාර්ෂික සාමාන්‍ය උෂ්ණත්ව අගය නිවර්තන කලාපයට වඩා අඩුය. වසර පුරා උෂ්ණත්වයේ අඩු වැඩි වීම් හේතුවෙන් ඍතුභේදය දකිය හැකිය.

* ශීත කලාපය - ප්‍රධානත ම ලක්ෂණය හිම වැටීම සහ වසර පුරා භූමිය හිමෙන් වැසී තිබීමයි

(ල. 05)

(මුළු ල. 10)

(03) 1. $27^0C$ (ල. 02)

2. වෙරළබඩ තැනිතලාව, අභ්‍යන්තර තැනිතලාව, මධ්‍යම කඳුකරය (ල. 03)

3. අ) 1. සමනල කඳු 2. පිදුරුතලාගල කඳු 3. නකල්ස් කඳු (ල. 03)

ආ) A - වැලිමඩ සානුව B - කොස්ලන්ද සානුව (ල. 02)

(මුළු ල. 10)

(04) 1. කිසියම් කාලයක් තුළ දී ප්‍රදේශයකට ලැබෙන මුළු වැසි ප්‍රමාණය වර්ෂාපතනය වේ.
ප්‍රධාන ක්‍රම ගණන = 03 (ල. 02)

2. ඊසානදිග මෝසම - මැයි - සැප්තැම්බර්
නිරිතදිග මෝසම - දෙසැම්බර් - පෙබරවාරි (ල. 03)

3. වසර පුරා බලපැවැත්වේ. මෝසම් වර්ෂාව සහ වාසුළි බලපැවැත්වෙන කාලයන්හි දී යටපත් වේ.
ශ්‍රී ලංකාවට විශේෂ කාලසීමා දෙකක දී බලපැවැත්වේ.
1. පළමු අන්තර් මෝසම - මාර්තු - අප්‍රේල්
2. දෙවන අන්තර් මෝසම - ඔක්තෝම්බර් - නොවැම්බර් (ල. 05)

(මුළු ල. 10)

(05) 1. පහතරට තෙත් කලාපය, පහතරට වියළි කලාපය, කඳුරට තෙත් කලාපය, පහතරට වියළි කලාපය, අර්ධ ශුෂ්ක කලාපය (ල. 02)

2. නිවර්තන තෙත් වනාන්තර, වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර, අතරමැදි සදාහරිත වනාන්තර, කඳුකර තෙත් වනාන්තර, කඳුකර වියළි කලාපීය වනාන්තර, කටුපඳුරු සහ වනලැහැබ, කඩොලාන (ල. 03)

3. වෘක්ෂලතා ස්තරවලින් යුක්තය, ශාක තද කොළ පැහැයෙන් යුක්තය, වසර පුරා ශාක වර්ධනය සිදු වේ, වනාන්තරය ඉහළ වියනක් සේ සැදී ඇත, යටි රෝපණ බහුල ය. (ල. 05)

(මුළු ල. 10)

(06) 1. පාරිසරික කටුක බවින් මිදීමටත් වන සතුන්ගෙන් හා සතුරන්ගෙන් ආරක්ෂා වීමටත් සාමූහික ව ජීවත් වීමටත්, මිනිසුන් ඒකරාශී වීමෙන් ජනාවාස බිහි වේ. (ල. 02)

2. ග්‍රාමීය, නාගරික, ගැමි නාගරික (ල. 03)

3. ග්‍රාමීය සහ නාගරික ජනාවාස දෙකෙහිම ලක්ෂණ තිබෙන ජනාවාස (ල. 05)

(මුළු ල. 10)